මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

__________________.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ආයතනයේ ............................ ලෙස සේවය කරනු ලබන .......................... මයා/මිය/මෙය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු කාර්යාලීය ලිපි ලේඛන අනුව නිවැරදි වේ. මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන:——————————
නම :————————————
තනතුර :————————————

දිනය :——————————

05-125

# පළාත් පාලන නිවේදන

**කළුතර නගර සභාව**

ත්‍රීරෝද රථ නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

255 අධිකාරිය වන නගර සභා අඥාපනතේ 157 (14 අ) අනු වගන්තිය මගින් පැවරී ඇති බලය අනුව එකී ආඥාපනතේ 153 වැනි වගන්තියේ විධිවිධාන අනුව කළුතර නගර සභාව විසින් සාදන ලදුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1652/ 50 සහ 2010 මැයි මස 06 වෙනි දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත කළුතර නගර සභා බල ප්‍රදේශය තුල ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 03:1 වැනි වගන්තිය ප්‍රකාරව අංක 1736 හා 2011.12.09 දිනැති *ගැසට් පත්‍රයෙන්* කළුතර නගර සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබීමේ ස්ථාන හා නවතා තැබිය හැකි උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව පිළිබඳව ප්‍රකාශයට පත් කර ඇත. එහි සඳහන් පිලිප් රෝහල ඉදිරිපිට ත්‍රීරෝද නැවතුම්පොළ පහත උපලේඛන i හි පරිදි අවලංගු කිරීමටත් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය අසළ ත්‍රීරෝද නැවතුම්පොළ පහත උපලේඛන ii හි පරිදි ඇති කිරීමටත් 2018.03.28 දිනැති තීරණ අංක 3022 යටතේ කළුතර නගර සභාව විසින් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ගීතානි ඩී. ලොකුවැල්ල,
ලේකම් හා සභාවේ බලතල
කාර්ය හා කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කළුතර නගර සභාව.

2018 ක් වූ මාර්තු මස 28 වැනි දින,
කළුතර නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය I

| *අවලංගු කළ ත්‍රීරෝද රථ නැවතුම්පොළ* | *උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව* |
|---|---|
| පිලිප් රෝහල ඉදිරිපිට | 06 |

උපලේඛනය II

| *නව ත්‍රීරෝද රථ නැවතුම්පොළ* | *උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව* |
|---|---|
| ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය අසළ | 06 |

05-47

---

## පළාත් පාලන දෙපාර්තමේන්තුව - දකුණු පළාත

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2017 මැයි මස 16 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටු නිර්දේශ අංක 05/21 හා තංගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ලංගප්පුලි තොම්සන්ගේ 2017.08.22 දින දරන තීරණ අංක 830 යටතේ දියුණු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ පහත සඳහන් තීරණය, ඉහත කී වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල යටතේ අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

රුවන් ගුණසිරි කන්නංගර,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
හම්බන්තොට.

2017 නොවැම්බර් මස 30 වැනි දින,
හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

### තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ ද, පහත උපලේඛනයේ ඇතුළත් කර ඇති සීමාවන් ඇතුළත පිහිටියා වූ ද, ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට ද, මේ යෝජනා සම්මතය සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු බවට සහ එකී ප්‍රදේශයේ පිහිටියා වූ සියලු නිශ්චල දේපළ වන සහ නිශ්චල දේපළ වර්ග වල වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමටත්, එසේ තක්සේරු කරනලද වාර්ෂික වටිනාකම් මත වරිපනම් නියම කිරීමටත්, 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ දකුණු පළාතේ, පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ඉල්ලා සිටිය යුතු යැයි, තංගල්ල ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශ අංක 05/21 යටතේ තංගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ලංගප්පුලි තොම්සන් වන මා විසින් තීරණ අංක 830 යටතේ තීරණය කරමි.

### උපලේඛනය

| *අනු. අංකය* | *ග්‍රාම නිලධාරී වසම* | *ග්‍රාම නිලධාරී වසමේ අංකය* |
|---|---|---|
| 01 | රන්න බටහිර | 252 |
| 02 | රන්න නැගෙනහිර | 253 |
| 03 | නෙටොල්පිටිය දකුණ | 257 |
| 04 | නෙටොල්පිටිය උතුර | 256 |

05-97

